බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ

කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණය සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව : බන්ධනාගාර | යොමු අංකය : ඩී8/21/බ.පරි/උප වැ.ප | දිනය :2014.11.10 |
| 1.2. අමාත්‍යාංශය : අධිකරණ හා කම්කරු සබඳතා | යොමු අංකය : MRPR/2/3/17-1/V.03 | දිනය :2014.11.19 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : | යොමු අංකය : DMS/B2/48/01/v01-II | දිනය:2013.09.24 |
| 1.4. ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය : EST-2/RECRU/05/4820 | දිනය:2015.01.06 |
| 1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය :NPC/6/18/096/SR-II | දිනය:2015.01.08 |
| 1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | යොමු අංකය: PSC/EST/03-01-32/01/2015 | දිනය: 2015.10.30 |

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3

3.2. ශ්‍රේණි : I, II, III,

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
ආයතනයන් හි විධායක කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතුවූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භකව හා /හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන් එනම් තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) මට්ටම පහ (05) යටතට ගැනෙන්නාවූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකළ යුතුය.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MT - 1 - 2006 (A)

5.2. වැටුප් පරිමාණය : රු:14,425 – 10 x 145 – 11 x 170 -6 x 240 – 14 x320 –23,665/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| 111 | පියවර 01 | රු:14,425/- |
| 11 | පියවර 12 | රු:,16,045/- |
| 1 | පියවර 23 | රු:17,985/- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.01. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| උප වැඩ පරීක්ෂක | III , II , I | 10 | සිවිල් ඉංජිනේරුවරයා විසින් පවරනු ලබන සැලසුම් සකස් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම ආදී රාජකාරි කටයුතු ඉටුකළ යුතුය. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 10

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා 111, 11 හා 1 සියල්ල ඒකාබද්ධ නිලධර සංඛාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7. 2. 1. බඳවා ගන්නා ශ්‍රේණිය : 111

7. 2. 2. සුදුසුකම්:

7. 2. 2 . 1. අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06)අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

7. 2. 2. 2. වෘත්තිය සුදුසුකම් : අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තිය කුසලතා ( NVQ) 05 වන මට්ටමේ හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7. 2. 2 . 3. පලපුරුද්ද : අදාළ නොවේ.

7. 2. 2. 4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් යෝග්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7. 2. 2. 5. වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත විය යුතුය.
III. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7. 2. 3. වයස
7. 2. 3. 1. : අවම සීමාව : අවුරුදු 18 යි.
7. 2. 3. 2. : උපරිම සීමාව : අවුරුදු 35 යි.

7. 2. 4. බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

7. 2. 4. 1. : ලිඛිත විභාගය : විෂය නිර්දේශය - ඇමුණුම 01

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 02 | විනයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

7. 2. 4 . 1. 1. පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7. 2. 4. 2. වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ.

7. 2. 4. 3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7. 2. 4. 3. 1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7. 2. 4. 4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7. 2. 5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම පළ කිරීම සහ . වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 කාර්යක්ෂමතා කඩඉම. (විෂය නිර්දේශය - ඇමුණුම 03) | 111 ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම. (විෂය නිර්දේශය - ඇමුණුම 04) | 11 ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම. | 1 වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත |

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂම කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
: බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

09. භාෂා ප්‍රවීණතාව :

9.1.

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

. ශ්‍රේණි උසස් කිරීම.

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

10. 1. 1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10. 1. 1. 1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10. 1. 1. 2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10. 2. 1. 1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයා ගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10. 2. 1. 2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

13.1 සක්‍රිය සේවා කාලය:

සක්‍රිය සේවා කාලය යනු නිලධාරියා ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාල හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

15. සෑම පත් වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන ..........................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : සී.එස්.අමරවික්‍රම
පරිපාලන නිලධාරී I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2016/03/ 29

පරීක්ෂා කළේ : අත්සන : ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එම්.වී. ගුණවර්ධන
නම : බන්ධනාගාර කොමසාරිස් (පාලන)
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2016/03/ 29

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
නිල මුද්‍රාව: බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

දිනය: 2016/03/29

යොමු අංකය : MPRRH/06/01/බන්ධ/බඳවා.ගැ.පටි
කළ.සහ.03

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 03 තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]

නම :

තනතුර: ලේකම්

V. Sivagnanasothy
Secretary
Ministry of Prison Reforms, Rehabilitation,
Resettlement and Hindu Religious Affairs
No 146, Galle Road, Colombo 03.

:අමාත්‍යාංශය

නිල මුද්‍රාව:

දිනය : 2016/04/26

---

යොමු අංකය : PSC/EST/03-01-32/01/2015

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි
කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ-3 සේවා ශ්‍රේණිය
සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2015 - 10 - 30 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : [signature]

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016/05/10

නිල මුද්‍රාව:

**එච්. එම්. ගාමිණි සෙනෙවිරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇ.ඳ

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ විවෘත පදනම මත බඳවා ගැනීමේ ලිඛිත විභාගය.

2. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |
| 02 | තාක්ෂණික දැනුම | පැය 3 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : පුරප්පාඩු පැවතීම අනුව වසරකට වරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැළපෙන ලෙස සකස්වනු ඇත. |
| තාක්ෂණ දැනුම | ගොඩනැගිලි ඉදිකිරීම් මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සැකසීමේ හැකියාව වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව දැනුම. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්.අමරවික්‍රම
තනතුර : පරිපාලන නිලධාරී I, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2016/03/24

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්.වී. ගුණවර්ධන
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (පාලන)
දිනය : 2016/03/ බන්ධනාගාර මූලස්ථානය කොළඹ - 09.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2016/03/29 කොළඹ 09.
නිල මුද්‍රාව :

ඇමුණුම 02

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100% | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | II, VII, XII, XIII, XIV, XVIV, XXII, XLVII පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | I, II, III, V පරිච්ඡේද |

සකස් කළේ :
අත්සන : ..........
නම : .......... සී.එස්. අමරවිකම
තනතුර : .......... ...ක් නිලධාරී
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2016/03/24

පරීක්ෂා කළේ
අත්සන : ..........
නම : .......... එම්.ඩී. ගුණවර්ධන
තනතුර : .......... බන්ධනාගාර කොමසාරිස් (පාලන)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2016/03/

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : .......... එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : .......... බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2016/03/24 කොළඹ 09.
නිල මුද්‍රාව : ..........

ඇමුණුම

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන දෙවන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බන්ධනාගාර ආඥා පණත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 02 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | සියලුම වගන්ති. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්.අමරවික්‍රම
තනතුර : පරිපාලන නිලධාරී I බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2016/03/24

පරීක්ෂා කළේ
අත්සන :
නම : එම්.වී. ගුණවර්ධන
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්ධනාගාර මූලස්ථානය කොළඹ - 09.
දිනය : 2016/03/24

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.
දිනය : 2016/03/29
නිල මුද්‍රාව : ..........

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන දෙවන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100% | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | I වන කාණ්ඩයෙහි සියලු පරිච්ඡේද හා II වන කාණ්ඩයෙහි සියලු පරිච්ඡේද |

සකස් කළේ :

අත්සන :

නම : සී.එස්.අමරවික්‍රම

තනතුර : පරිපාලන නිලධාරි I, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

දිනය : 2016/03/

පරීක්ෂා කළේ

අත්සන :

නම : එම්.වී. ගුණවර්ධන

තනතුර : බන්ධනාගාර කොමසාරිස් [illegible]), බන්ධනාගාර මූලස්ථානය, කොළඹ - 09.

දිනය : 2016/03/

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජ[illegible]රාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය : 2016/03/

නිල මුද්‍රාව :